# 13. විරාම ලක්ෂණ

කතා බහ කරන විට, අදහස් අවධාරණය කිරීම, හැඟීම් ප්‍රකාශ කිරීම සඳහා හඬ උස්පහත් කිරීම, අභිනය උපයෝගී කර ගැනීම වෙනුවට ලේඛනයේදී යොදා ගනු ලබන්නේ විරාම ලක්ෂණයි. ලේඛනයේදී විරාම ලක්ෂණ නිසි ලෙස භාවිත කිරීම ඉතා වැදගත් ය.

මේ බලන්න

ළමයා මළා. ළමයා මළ බව මින් ප්‍රකාශ වේ.

ළමයා මළා? මෙසේ සටහන් වුවහොත් එයින් කිසියම් ප්‍රශ්නයක් ගොඩ නැගේ.

ළමයා මළා! මෙසේ ලියා ඇත්නම් එය පුදුමයට කරුණක් බව හැඟ වේ.

මේ අනුව කිසියම් අදහසක් ලියා දැක්වීමේ දී විරාම ලක්ෂණ ඉතා වැදගත් බව පැහැදිලි වනු ඇත.

මේ වාක්‍ය ද පරීක්ෂා කර බලන්න.

1. විත්තිකරු නිදහස් කරන්න. එපා මරන්න.
2. විත්තිකරු නිදහස් කරන්න එපා. මරන්න.

පළමු වැකියේ දී නිදහස ලබන විත්තිකරු නැවතීමේ තිත නිසා දෙවැනි වැකියේ දී එල්ලුම් ගස් යයි.

බලන්න විරාම ලක්ෂණ කොයි තරම් වැදගත් ද කියා. මේ බලන්න,

1. ඔහු අල්ලාගෙන ආ මසුන් ඉවත දමන්න.
2. ඔහු අල්ලා, ගෙන ආ මසුන් ඉවත දමන්න.

එකම වාක්‍යයේ විරාම ලක්ෂණ නිසා අදහස වෙනස් වේ. මෙයින් පැහැදිලි වන්නේ නිසි තැන විරාම ලකුණ යෙදිය යුතු බවත්, අනවශ්‍ය තැන එය නොයෙදිය යුතු බවත් ය.

මෙම පරිච්ඡේදයෙන් පහත සඳහන් විරාම ලක්ෂණ පිළිබඳව හඳුනා ගනිමු.

## දෙතිත :

* නිදසුන් පිණිස හෝ විස්තර පිණිස කරුණු ඉදිරිපත් කිරීමේ දී දෙතිත යෙදේ.
  නිදසුන : ලද පස් මල් : සුදු අබ, සමන් කැකුළු, සුන් සහල්, ඊතණ, විලඳ

* ගණිත ප්‍රකාශනයක අනුපාතය යෙදීම සඳහා ද භාවිත වේ.
  3 : 2 අනුපාතයට එම මුදල කොටස් කරන්න.

* සංවාද ලියා දැක්වීමේ දී ද දෙතිත යෙදේ.

* ගුරු හාමුදුරුවෝ : පොඩි නම අභ්‍යාස ලියාගෙන ආවා ද?
  පොඩි නම : එහෙයි

## තිත් පෙළ . . .

* ප්‍රකාශනයක ඌනත්වයක් ඇති බව දැක්වීමේ දී තිත් තුනක් යෙදේ.



ලංකාවේ ඇතැම් පුරාණ ගොඩනැගිලිවල පියගැට පෙළ පාමුල තිබුණු අඩ සඳකට සමාන ගල් පුවරුව . . . නමින් හැඳින්වේ.

* උද්ධෘත පාඨයකින් මුල හෝ මැද හෝ කොටසක් අත් හළ බව දැන්වීමේ දී තිත් තුනක් යෙදේ.
  ''සව්සිරිනි සාරය . . . වෙළුවන නම් වී විහාරය''

* ප්‍රකාශයක හිස් තැන් දැක්වීම සඳහා ද තිත් තුන යෙදේ.
  කොළඹ සිට යාපනයට දුර කිලෝ මීටර් . . . කි.

* අදහසක් අවධාරණය කරනු සඳහා ද තිත් තුන භාවිත වේ.
මහ හඬක් . . . අඳෝනාවක් . . . බිළිඳෙක් . . .

## තිත් හතර . . . .

* උද්ධෘත පාඨයකින් අග කොටස අත් හළ බව දැන්වීමේ දී තිත් හතර යෙදේ.
සව්සිරිනි සාරය
නිරිඳුගෙ බිම්බිසාරය
එපුරෙහි උදාරය . . . .

## ඇල ඉර

විකල්ප ව්‍යවහාර දක්වීම සඳහා ඇල ඉර භාවිත වේ.

* මේස / තේ හැඳි දෙක බැගින් උදේ / සවස කෑමට පෙර / පසු බොන්න.

* ගරු ස්වාමින් වහන්ස / මහත්මයාණෙනි / මහත්මියනි.

## ක්‍රියාකාරකම 13.1

පහත සඳහන් ආරාධනා පත්‍රය සුදුසු විරාම ලකුණු යොදා නැවත ලියන්න.

සුන්දරාගම ශ්‍රී සණානන්ද මහා පිරිවෙනේ
සිංහල සාහිත්‍ය සංගමය
ඔවුන්ගේ වාද කණ්ඩායම සමග
මිනිසා හැඩගැසිය හැක්කේ
ආගමෙන් ද නීතියෙන් ද
යන මැයින්
2014 ජනවාරි 04 වනදා
සවස 0300 0500 දක්වා
සිය පිරිවෙන් ප්‍රධාන ශාලාවේ දී
පැවැත්වෙන සුහද විවාදයට
සහභාගි වන මෙන්

සුන්දරගම මහා විද්‍යාලයේ වාද කණ්ඩායමට
සාදරයෙන් ආරාධනය කෙරෙයි

## ක්‍රියාකාරකම 13.2

පහත සඳහන් විරාම ලකුණු සඳහා උදාහරණ තුන බැගින් ලියන්න.

1. දෙතිත
2. කෙටි ඉර
3. ඇල ඉර

## ක්‍රියාකාරකම 13.3

පහත දැක්වෙන ඡේදය අදාළ විරාම ලකුණු යොදා නැවත ලියන්න.

කිරිහාමි පඳුරු අස්සේ මළාක් මෙන් සිටි එඬේරෙක් කැලෑව මැදින් හරක් දක්කාගෙන එයි කිරිහාමි හරක් රැළ දකියි හරකුන්ගේ කුරෙහි මහත ද අඟෙහි දිග ද හොඳ හැටි පෙනේ හරක් රැළ ළංවන විට කිරිහාමිට තමා මැරුණු බව අමතක වෙයි කිරිහාමි වහා නැගිට එඬේරාට බනින්නට පටන් ගනියි.

**කිරිහාමි** පව්කරයා හරකුන් දක්කන්නේ මළවුන්ගේ ඇඟ උඩින් ද මෙහෙම පව් කළාම යන්නේ කොයි ලෝකෙද

**එඬේරා** මැරුණු කාගේ ඇඟ උඩින් ද මම හරකුන් දැක්කුවේ

**කිරිහාමි** ඇයි මගේ ඇඟ උඩින් නොවැ

**එඬේරා** හහ් හහ් හා මේ කතා කරන්නේ මැරිලා ද

**කිරිහාමි** ඔව් හිසත් පයත් එක හැටි හීතල වුණු දා මැරෙන බව දිවැස් ඇති අපේ හාමුදුරුවෝ කීවා අද වැස්සට තෙමිලා මගෙ හිසත් පයත් එක හැටි හීතල වුණා
මම මළා

**එඬේරා** අපොයි මදෑ මම දැනගෙන හිටියේ නැ ඒ වග ඉතින් ඒ ගිය පණ ගෙන්නාගන්න ගුරුකමක් කළේ නැද්ද

**කිරිහාමි** අනේ නෑ

**එඬේරා** ගිය පණ ගෙන්වා ගන්න කැමති ද

**කිරිහාමි** අනේ ඔව් ඔබ ගුරුකමක් දන්නවා නම් කරන්න පණ තිබෙන තුරා ඔබට මෙහෙ කරනවා

**එඬේරා** හොඳයි මම ඔබට උදව් කරන්නම් මගේ ගුරුකම එතරම් අමාරු එකක් නෙවෙයි මගේ හරකුන් එහෙම ඉඳලා හිටලා මැරෙනවා එතකොට මා උන්ගේ පණ ගෙන්වා ගන්නේ මෙන්න මේ කෙවිටෙන් මම ගුරුකම කරන්නම් මෙතන බිම මුනින් අතට වැතිරෙන්න කිරිහාමි මුනින් අතට බිම දිගාවෙයි

**එඬේරා** හැබැයි පණ එන විට ටිකක් රිදෙයි ඊට බිය වෙන්න එපා හැකි තරම් වෙරෙන් කෙවිටෙන් පහර දෙයි එකයි දෙකයි තුනයි හතරයි පහයි හයයි හතයි

**කිරිහාමි** අයියො ඇති ඇති පණ ආවා පණ ආවා කිරිහාමි කෑගසමින් නැගිටියි.

**කුමාරණතුංග මුනිදාසයන්ගේ
හත්පණ ඇසුරෙනි.**